ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2023-02-08 |
|---|---|---|---|

පැමිණිලි පාර්ශවය : එච්.ජී.අමිල මධුශංඛ මහතා,
අංක 30/20, ලේවැල්ල පාර,
බංගලාවත්ත, මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
මහ/මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**පැමිණිලි අංක :- HRC/KND/131/22/A**

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2022 වර්ෂයේ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ පළමු වසරට තම දියණිය ඇතුළත් කිරීම සඳහා අයදුම්පතක් යොමු කර කැඳවුම් අංක R-61 යටතේ 2021.11.13 පැවති සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 74ක් ලබා ගත් බවත්, ඉන්පසු ප්‍රසිද්ධ කරන ලද තාවකාලික ලැයිස්තුවේ තොරාගත් අයෙකු ලෙස 87 ස්ථානයට තේරී පත් වී සිටින බවත්, එම නිසා තමා අභියාචනයක් හෝ විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ බවත්ය. පසුව විද්‍යාලයේ අභියාචනා විරෝධතා පරීක්ෂණ වලින් පසුව ප්‍රසිද්ධ කරන ලද ස්ථිර නාම ලේඛනයේ තමාගේ දියණියගේ නම 87 ස්ථානයෙන් ඉවත් කර පොරොත්තු ලේඛනයේ I වැනි ස්ථානයට ස්ථානගත කිරීම හේතුවෙන් චක්‍රලේඛනයේ උපදෙස් වලට පටහැනිව කටයුතු කර ඇති බවත්, ඒ අනුව තමාගේ දරුවා මහනුවර මහමායා බාලිකා විද්‍යාලයට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත්, එයින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් දක්වා ඇත. මේ පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් සිදු කර තම දියණිය එම විද්‍යාලයට ඇතුළත් වීමට ඇති අවස්ථාව තහවුරු කර දෙන ලෙසට පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය විසින් මේ සම්බන්ධයෙන් වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර එච්.ජී අමිල මධුශංඛ යන අයගේ දියණිය වන එච්.ජී.ආර් නෙවින්කා යන අය මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා R-61 යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර තිබූ බවත්,

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දීමෙන් අනතුරුව සකස් කරන ලද තාවකාලික ලේඛනයේ එම දරුවාගේ නම ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අවසාන නම වශයෙන් ඇතුළත්ව තිබූ බවත්, පාසලේ දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් අභියාචනා හා විරෝධතා මණ්ඩලය වෙත පැමිණි අභියාචනා සලකා බැලීමෙන් පසු එකී මණ්ඩලය විසින් ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ලකුණු ලබා දී තිබූ එක් දරුවකුගේ පදිංචිය ස්ථානීය පරීක්ෂණයේදී තහවුරු වීම මත, එම දරුවාගේ නම ස්ථිර නාම ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කළ බවත්, ඒ හේතුව මත පැමිණිලිකරුගේ දියණියගේ නම අවසාන ලේඛනයෙන් ඉවත් කිරීමට සිදු වූ බවත්, එම ලේඛනය අභියාචනා හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සකස් කළ බවත්, 29/2019 චක්‍රලේඛනයට අනුව පැමිණිලිකරුගේ අයිතිවාසිකම් කඩ වීමක් සිදු කිරීමට කටයුතු කර නොමැති බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණ වන කරුණු :-**

පැමිණිලිකරුගේ දියණිය 2022 වර්ෂයේ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ පළමු වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර, කැඳවුම් අංක R-61 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු ලකුණු 74ක් ලබාගෙන තාවකාලික ලැයිස්තුවේ 87 වන ස්ථානයට තේරී පත්වී ඇත්තේ, තාවතාලික තේරීම් ලේඛනයේ අවසාන නම වශයෙන් වේ.

අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය වෙත ලැබී ඇති අභියාචනාවක් පරීක්ෂා කිරීමෙන් පසු එම දරුවා අවසාන තේරීම් ලේඛනයට ඇතුළත් වීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා අවසාන තේරීම් ලේඛනයෙන් ඉවත්වීම මත පාසලට ඇතුළත් වීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

පාසල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීමේ 29/2019 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍ර ලේඛනයේ 12.1.2 අනුව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ වලින් සුදුසුකම් ලබා තාවකාලික ලැයිස්තුවේ

නිසි තැන් වලට ළමයින් ඇතුළත් වන අවස්ථාවේදී, තාවකාලික ලැයිස්තුවේ අවසානයට සිටින ළමයින් එම ලැයිස්තුවෙන් ඉවත් වන අවස්ථා වලදී එවැනි ළමයින්ගේ මව්පියන් නැවත අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් කැඳවා ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසුව අවසාන ලැයිස්තුව සකස් කළ යුතු බව සඳහන් වුවද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය එලෙස කටයුතු කර නොමැති බව තහවුරු වේ.

කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවීය නියෝජිතයින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, උක්ත අංක 03 යටතේ පැමිණිලි පාර්ශවයේ සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා පැමිණිලිකරු කැඳවීමට දුරකථන පණිවිඩයක් ලබා දීමට උත්සාහ කළද, ඔහුව සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ බව අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කළ බවයි. එහෙත් මහනුවර මහාමායා විද්‍යාලයෙන් අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයා හෝ තමන් වෙත දුරකථන ඇමතුමක් ලබා නොදුන් බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කළ අතර, වගඋත්තරකාර නියෝජිතයින් උක්ත ප්‍රකාශය තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එවැනි දැනුම් දීමක් සිදු කිරීමට කටයුතු කළ බව තහවුරු නොවේ.

කොමිෂන් සභාව මඟින් 2018.10.04 දිනැතිව නිකුත් කර ඇති පැමිණිලි අංක HRC/K/722/7(W) දරණ පැමිණිල්ලට අදාළ නිර්දේශ මඟින්ද තහවුරු කර ඇත්තේ, චක්‍රලේඛනයේ 12.1.2 අනුව එම පැමිණිල්ලේද පැමිණිලි පාර්ශවයට අවස්ථාව නොදීම මඟින් එම පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් එම පැමිණිලිකරුගේ දරුවාත් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයට ඇතුළත් කළ යුතු බවයි.

**නිගමනය :-**

ඉහත කරුණු අනුව වගඋත්තර පාර්ශවීය මහනුවර මහාමායා විද්‍යාලයේ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය චක්‍රලේඛනයේ 12.1.2 අනුව පැමිණිකරුට ඇති අභියාචනා අයිතිය අහිමිකිරීම මඟින් පැමිණිලි පාර්ශවයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැළකිලි ලැබීමේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකරුගේ දියණිය වන එච්.ජී.ආර් නෙවින්කා දියණිය 2022 වර්ෂයේ පළමු වසර සඳහා මහනුවර මහාමායා විද්‍යාලයට ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.03.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/